සැ. යු. - 2023.07.14 දින පළ වූ අංක 2341 *ගැසට් පත්‍රයේ* I-II(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,342 - 2023 ජූලි මස 21 වැනි සිකුරාදා - 2023.07.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 478 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 480 |


*සැ. යු.*- (i) විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත, 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත, 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 අගෝස්තු මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජූලි මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**මාරවිල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියයි

ලෝරන්ස් මිල්රෝයි මිරැන්ඩා,
කෝට්ටපිටිය, බංගදෙනිය.

*.............පැමිණිලිකරු.*

නඩු අංකය : 225/MB
වර්ගය : උකස්
වටිනාකම : රු. 43,00,000

*එදිරිව*

01. රණසිංහ ආරච්චිගේ චමත් නිශේන්ද්‍ර,
සුදුවැල්ල පාර, කොලින්ජාඩිය,
වෙන්නප්පුව. සහ තවත් අය.

*............විත්තිකරුවන්.*

විත්තිකරු විසින් වර්ෂ 2013ක් වූ නොවැම්බර් මස 26 වැනි දින පැමිණිලිකරුගෙන් ලබා ගන්නා ලද රුපියල් ලක්ෂ විසිපහ (රු. 25,00,000/-) මුදල හා එදින පටන් වර්ෂ 2015.05.31 වැනි දින දක්වා මසකට 4% බැගින් ගෙවිය යුතු පොළිය වන රුපියල් ලක්ෂ 18ක (රු. 18,00,000) මුදල ද සමග එකතුව වශයෙන් රුපියල් ලක්ෂ 43 (රුපියල් 43,00,000) මුදල ද ඒ මත පැමිණිල්ලේ දින සිට දක්වා ද එතැන් පටන් සම්පූර්ණ මුදල ගෙවා අවසන් වන තෙක් නෛතික පොළිය ද සමග පැමිණිලිකරුට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇත. තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරු විසින් පැමිණිලිකරුට මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට අධිකරණය අවසර දී ඇති බැවින් ද මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම,

**වර්ෂ 2023 ක් වූ අගෝස්තු මස 14 වැනි දින පෙ.ව. 10.00ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත් දකුණු පිටිගල් කෝරළයේ, මැද පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සහ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ වූ මාවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාවිල නමැති ග්‍රාමයේ පිහිටි කීනකැළේ වත්ත නමැති ඉඩමේ කොටසකට එස්. ජී. රණසිංහ බලයලත් මානකවරයා විසින් මැන සකස් කරන ලද ඔහුගේ අංක 1816 සහ 2003.12.11 දින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද කැබලි අංක 10 දරන, උතුරට : ලොට් 11 ද, නැගෙනහිරට : ලොට් 132 ද, දකුණට : ලොට් 09 ද, බස්නාහිරට : එම්. පීටර් ප්‍රනාන්දු මානකවරයාගේ අංක 1058 දරන පිඹුරේ නිරූපිත කීනකැළේ වත්ත කියන ඉඩමේ එස්. එම්. ප්‍රමිලා ද සොයිසාට අයිති ලොට් බී දරන කොටස ද යන සතර මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම තුනයි පහක් (පර්. 15.35) ක් හෙවත් හෙක්ටයාර 0.03882ක් විශාල ඉඩම් කොටස හා ඒ මත පිහිටි ගහකොළ පළතුරු ආදී ඊට අයත් අනෙකුත් සෑම දේත් වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ J 146/216 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත් දකුණු පිටිගල් කෝරළයේ, මැද පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සහ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ වූ මාවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාවිල නමැති ග්‍රාමයේ පිහිටි කීනකැළේ වත්ත නැමැති ඉඩමේ කොටසකට එස්. ජී. රණසිංහ බලයලත් මානකවරයා විසින් මැන සකස් කරන ලද ඔහුගේ අංක 1816 සහ 2004.01.12 දින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද කැබලි අංක 11 දරන, උතුරට : ලොට් 12 ද, නැගෙනහිරට : ලොට් 132 ද, දකුණට : ලොට් 10 ද, බස්නාහිරට : එම්. පීටර් ප්‍රනාන්දු මානකවරයාගේ අංක 1058 දරන පිඹුරේ නිරූපිත කීනකැළේ වත්ත කියන ඉඩමේ එස්. එම්. ප්‍රමිලා ද සොයිසාට අයිති ලොට් බී දරන කොටස ද යන සතර මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම තුනයි පහක් (පර්. 15.35) ක් *හෙවත්* හෙක්ටයාර 0.03882ක් විශාල ඉඩම් කොටස හා ඒ මත පිහිටි ගසකොළ, පළතුරු ආදී ඊට අයත් අනෙකුත් සෑම දේත් වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ J 118/254 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත.

*ඉඩමට පිවිසීම.-* කොළඹ හලාවත මාර්ගයේ කීනකැළේ හන්දියෙන් වමට ප්‍රධාන පාරේ සිට මීටර් 500 දුරින් ''ඉටලියන් ගේට්'' වත්ත

විමසීම් :- මාරවිල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් - 032-2254291

එස්. එම්. වික්‍රමනායක ආරච්චි,
රෙජිස්ට්‍රාර්/නි. පිස්කල්.

07-190

## රත්නපුර දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ඇස්කීසි අංකය : 300/2022
නඩු අංකය : 38898
ස්වභාවය : මුදල්
වටිනාකම : රු. 833,332.05
ක්‍රියාපටිපාටිය :

1994 අංක 09 දරන පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පටිපාටිය අනුව.

කොළඹ 02, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ, අංක 75 දරන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටි සහ කිරිඇල්ල යන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුව.

*..............පැමිණිලිකාර - ආයතනය.*

*එදිරිව*

1. වෙදගේ ප්‍රියන්ත දීපාල් වික්‍රමසිංහ,
   නැදුන් විහාර හන්දිය, හිඳුරංගල පාර, කිරිඇල්ල.

2. දියුණුගේ ගෙදර අනිල් රූපසිංහ,
   ''තිළිණි'',
   දඹුළුවන, කහවත්ත.

3. මීගස්මුල්ලගේ කිත්සිරි කපිල පියදස,
   අංක 111/ඒ,
   අමුහේන්ගොඩැල්ල,
   කිරිඇල්ල.

*..............විත්තිකරුවන්.*

රත්නපුර දිසා අධිකරණයේ පැවති ඉහත අංක දරන නඩුවේ 2022 ජුනි මස 22 වැනි දින දරන තීන්දුව පරිදි ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකාර ආයතනයට ගෙවිය යුතු බවට නියම කරන ලද මුදල වන රුපියල් 833,332.05ක මුදල නොගෙවීම නිසා එය අයකර ගැනීම සඳහා නිකුත් කරන ලද ඇස්කීසියේ බලය පිට මා විසින් 2022.11.04 වැනි දින තහනමට ගන්නා ලද පහත සවිස්තරව දක්වා ඇති භාණ්ඩ, තහනමට ගන්නා ලද ස්ථානය වන විත්තිකරු පදිංචි නැදුන් විහාර හංදිය, හිඳුරංගල පාර, කිරිඇල්ල යන ලිපිනයේ දී වර්ෂ **2023ක් වූ අගෝස්තු මස 09 වැනි දින පෙ.ව. 11.30ට** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

***භාණ්ඩ විස්තරය :***

| | | |
|---|---|---|
| 1. | ලී අල්මාරි | 01 |
| 2. | LG TV | 01 |
| 3. | හිටවන විදුලි පංකා | 01 |
| 4. | ලී පුටු සෙට් | 01 |
| 5. | පියන් 2 අල්මාරි | 01 |
| 6. | ලී මේස | 01 |
| 7. | කෑම මේස | 01 |
| 8. | කෑම මේස පුටු | 04 |
| 9. | රබර් ඩයමන්ඩ් රෝල | 01 |
| 10. | ලී අල්මාරි | 01 |
| 11. | කණ්නාඩි මේස | 01 |

එච්. පී. සී. ජී. හේවාවසම්,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - රත්නපුර.

2023 ජුනි මස 06 වැනි දින,
රත්නපුර දිසා අධිකරණයේ දී ය.

07-275

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

නාලක ගොඩහේවා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ, ''ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

(අ) ශ්‍රී ලංකා ධීවර හා ධීවර ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියුක්ත වූ අය අතර, ඵලදායී අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය සහ සහයෝගය ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ එවැනි කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සහසම්බන්ධව සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඇ) ජලජ සම්පත් සංවර්ධනය සහ සංරක්ෂණය හා සම්බන්ධ ගැටළු හා ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම සඳහා විද්‍යාඥයන්ට සහ වෙනත් පුද්ගලයන්ට වේදිකාවක් ලෙස කටයුතු කිරීම,

යනාදිය වේ.

නාලක ගොඩහේවා,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

07-334

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ශ්‍රී ලංකා කෘෂි ව්‍යවසායකයින්ගේ සංසදය (SLAF) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

මෛත්‍රීපාල සිරිසේන වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ, ''ශ්‍රී ලංකා කෘෂි ව්‍යවසායකයින්ගේ සංසදය (SLAF) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංසදය සංස්ථාගත කිරීමයි :-

(අ) කෘෂි ව්‍යාපාරික ක්ෂේත්‍රය ප්‍රවර්ධනයට සහ ක්ෂේත්‍රයේ දියුණුවට මඟ පෙන්වන දූරදර්ශී සංකල්ප හා භාවිතයන් පිළිබඳව කෘෂි ව්‍යාපාරික වෘත්තියන් හි නියැලෙන්නන් වෙනුවෙන් උත්ප්‍රේරකයක් ලෙස හා විශේෂඥ මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීම,

(ආ) තාක්ෂණික නිරීක්ෂණ කණ්ඩායමක් ලෙස සේවය කිරීම සහ නව නිපැයුම්, නවීන හා කාර්යක්ෂම කෘෂිකාර්මික භාවිතයන් හුවමාරුව හා කෘෂි ව්‍යාපාරික සංවර්ධනය සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම,

(ඇ) කෘෂි ව්‍යාපාර හා සම්බන්ධ සියලු අංශයන්ගේ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, පරිචය සංග්‍රහ, ප්‍රමිතීන්, පර්යේෂණ හා සංවර්ධනය සහ නව නිපැයුම් සැකසීම සඳහා උපදේශන සේවා සැපයීම,

යනාදිය වේ.

මෛත්‍රීපාල සිරිසේන,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
පොළොන්නරුව දිස්ත්‍රික්කය.

07-211

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.